00008

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන -2022/2023

5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2023

SNU5336/ESU3136 - විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ දාර්ශනික පදනම

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2023.10.21 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

<u>1 වන කොටස</u>

01. විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය යන සංකල්පය ඔබේ වචනයෙන් විස්තර කරන්න.

02. අන්තර්කරණ පන්ති කාමරවල ඉගැන්වීම් කටයුතුවල යෙදෙන ගුරුවරුන්ට අධ්‍යාපනයේ මූලධර්ම පිළිබඳ නිපුණතා වැදගත් වීමට හේතු පහක් (05) සඳහන් කරන්න.

03. දුබලතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීමට සහාය වන එක්සත් ජාතීන්ගේ ප්‍රකාශන සහ සම්මුතීන් පහක් (05) නම් කරන්න.

04. විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ අරමුණු ලැයිස්තුගත කරන්න.

05. ලිබරල්වාදී පර්යාලෝකයට අනුව අධ්‍යාපනයේ ප්‍රධාන කාර්යය පිළිබඳ උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

06. "අධ්‍යාපනය නිදහස් හා ස්වාධීන දරුවකු බිහි කළ යුතුයි." මහත්මා ගාන්ධි

    විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ සංවර්ධනයට අනුකූලව ඉහත සඳහන් ප්‍රකාශය පැහැදිලි කරන්න.

07. සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමය තුළ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සියුන් ඒකීකරණය කිරීමේ සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

08. "අන්තර්කරණ අධ්‍යාපනය කණ්ඩායම් ප්‍රවේශයක් ලෙස විස්තර කරයි."
    මෙම ප්‍රකාශය කෙටියෙන් සාධාරණීකරණය කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) ප්ලේටෝ විසින් හඳුන්වා දුන් අධ්‍යාපනික වැඩසටහන සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) පන්ති කාමරයේ විවිධත්වයෙන් යුත් සිසුන් සම්බන්ධ ව ජීන් ජැක්ස් රූසෝ විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යාපනික මූලධර්ම ගවේෂණය කරන්න. (ලකුණු 06)

(iii) ජීන් ජැක්ස් රූසෝ විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් කළ මූලධර්ම පන්ති කාමරය තුළ විවිධත්වයෙන් යුත් සිසුන් සඳහා යෙදිය හැකි ආකාරය උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10)

10. (i) රාඔ සහ පිරිස (2004) දී ඉදිරිපත් කරන ලද විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ මූලධර්ම හත **(07)** උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 05)

(ii) ශ්‍රී ලංකා අධ්‍යාපන ක්‍රමය තුළ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ ඉහත සඳහන් කළ මූලධර්ම ක්‍රියාවට නැංවීමේ දී ඇති වන අභියෝග උදාහරණ සමඟින් පරීක්ෂා කරන්න. (ලකුණු 07)

(iii) ඉහත සඳහන් කරන ලද අභියෝග ජය ගැනීමට ක්‍රියාමාර්ග හතරක් **(04)** යෝජනා කරන්න. (ලකුණු 08)

11. (i) ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ වෘත්තීය අධ්‍යාපන භාවිතයන්වල වැදගත්කම ගවේෂණය කරන්න. (ලකුණු 06)

(ii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ වෘත්තීය අධ්‍යාපන භාවිතයන්ට අනුකූලව මහත්මා ගාන්ධි සහ කාල් මාක්ස් විසින් යෝජනා කරන ලද අධ්‍යාපන මූලධර්ම සංසන්දනය කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ගේ වෘත්තීය අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා මහත්මා ගාන්ධි සහ කාල් මාක්ස් විසින් යෝජනා කරන ලද මූලධර්ම ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද? (ලකුණු 08)

12. (i) විශේෂ පාසල් අධ්‍යාපනය යන සංකල්පය ඔබේ වචනවලින් නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ට අධ්‍යාපනය ලබා දීමේ දී දෙමාපියන්ගේ සහ පවුලේ සාමාජිකයන්ගේ කාර්යභාරයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත තම දරුවන්ට අධ්‍යාපනය ලබා දීමේ දී දෙමාපියන් සහ පවුලේ සාමාජිකයන් මුහුණ දෙන අභියෝග මොනවාදැයි සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) සාරධර්ම අධ්‍යාපනය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05)

(ii) "විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා නොමැති සිසුන්ට වඩා විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සමඟ කටයුතු කිරීමේ දී වඩාත් වැදගත් කරුණ වන්නේ සාරධර්මයයි."

උදාහරණ දක්වමින් ඉහත ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 06)

(iii) අන්තර්කරණ පන්තියක ගුරුවරයෙකු ලෙස, ශ්‍රී ලංකාවේ අන්තර්කරණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් අතර සාරධර්ම වැඩිදියුණු කිරීම සඳහා ඔබට භාවිත කළ හැකි උපාය මාර්ග මොනවා ද? (ලකුණු 09)

14. (i) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවකුගේ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා ජාතික මට්ටමේ පරමාර්ථ සහ අරමුණුවල වැදගත්කම, උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාවේ දී නිසි අධ්‍යාපනයක් ලබා ගැනීමේ දී විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ශිෂ්‍යයන් මුහුණ දෙන අභියෝග මොනවාදැයි උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) ශ්‍රී ලංකාවේ දුබලතා සහිත දරුවන්ට නිසි අධ්‍යාපනයක් ලබා ගැනීමට ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා උපාය මාර්ග කිහිපයක් යෝජනා කරන්න. (ලකුණු 08)

හිමිකම ඇවිරිණි.